DOI : 10.31357/fhssmst.2013.00672

# රාජකාරී කටයුතු තුළදී ශ්‍රී ලාංකීය පොලිස් නිලධාරීන්ගෙන් සැකකරුවන්ට සිදු වන හිංසාකාරී ක්‍රියා පිළිබඳ අපරාධ විද්‍යාත්මක අධ්‍යයනයක්.

වේලාතන්ත්‍රිගේ සමන්ත උදය කුමාර.

03 MAY 2016

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අපරාධ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ

නිබන්ධය - 2013.

පර්යේෂකගේ සටහන.

මෙම ශාස්ත්‍රීය නිබන්ධය සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය එම්.ඩබ්.ජයසුන්දර මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත් මෙම පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවත් සහතික කරමි.

--------------------- 2015/03/27

පර්යේෂක දිනය

උපදේශකවරයාගේ සහතිකය.

රාජකාරී කටයුතු තුළදී ශ්‍රී ලාංකීය පොලිස් නිලධාරීන්ගෙන්සැකකරුවන්ටසිදු වන හිංසාකාරී ක්‍රියා පිළිබඳ අපරාධ විද්‍යාත්මකඅධ්‍යයනයක් නැමති මෙම පර්යේෂන නිබන්ධය මාගේ උපදේශකත්වයයටතේ සම්පාදනය කරන ලද බවත් මෙම නිබන්ධය ඇගයීම් කාර්යය සඳහා විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමි.

------------------------------ 2016/05/03

මහාචාර්ය. එම්.ඩබ්.ජයසුන්දර, දිනය.

සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය.

Prof. M.W. Jayasundara

Department of Sociology & Anthropology
University of Sri Jayewardenepura
Nugegoda.

පරීක්ෂක මණ්ඩලය විසින් නිර්දේශිත සියලු නිවැරදි කිරීම්, සංශෝධන සහ එකතුකිරීම් උපාධි අපේක්ෂක විසින් අවසාන නිබන්ධය සඳහා ඇතුලත් කර ඇති බව මෙයින් සහතික කරමි.

උපදේශකගේ අත්සන. ----------------

දිනය. 2016/05/03

**Prof. M.W. Jayasundara**

**Department of Sociology & Anthropology**
**University of Sri Jayewardenepura**
**Nugegoda.**

# ස්තුතිය.

මෙම පර්යේෂණ නිබන්ධය සාර්ථක කර ගැනීම සඳහා ගුරුහරුකම් ලබා දෙමින් මා දිරිමත් කළ මහාචාර්ය එම්. ඩබ්ලිව්. ජයසුන්දර ගුරුතුමා, ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර ගුරුතුමා, විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති ආචාර්ය කිංස්ලි වික්‍රමසූරිය ගුරුතුමා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය උදය කුමාර ගුරුතුමා අතුළු ගුරු මඬුල්ලට,

මෙම පර්යේෂණ නිබන්ධය සඳහා අවශ්‍ය තොරතුරු ලබා දෙමින් සහයෝගය දැක්වූ ශ්‍රී ලංකා පොලිස් මූලස්ථානයේ සංඛ්‍යාලේඛන කොට්ඨාසයේ අධ්‍යක්ෂ තුමා, ස්ථානාධිපති තුමා ඇතුළු කාර්යය මණ්ඩලයට, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ විමර්ශණ නිලධාරී රනිල් අබේනායක මහතාට, නිකවැරටිය, කුරුණෑගල, අනුරාධපුර මූලස්ථාන පොලිස් ස්ථානයන්හි මූලස්ථාන පොලිස් පරීක්ෂක තුමන්ලාට, වයඹ පලාත් සභාවේ සැලසුම් අංශයේ සැලසුම් නිලධාරී සිසිර කුමාර මහතාට , අනුරාධපුර ප්‍රාදේශීය ලෙකම් කාර්යාලයේ සංඛ්‍යා ලේඛණ නිලධාරී කුමාරසිරි බණ්ඩාර මහතාට,

පාඨමාලාවේ අධ්‍යයන කටයුතු සඳහා විවිධාකාරයෙන් සහයෝගය ලබා දෙමින් මා දිරිමත් කළ ජේ.නි. පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතාට, නි.පො.ප. අජිත් වික්‍රමසේකර මහතාට, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ජයන්ත වික්‍රමරත්න මහතාට,ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය, කළුතර , අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී සංජීව ධර්මරත්න මහතාට, උ.පො.ප. අබේවික්‍රම මහතා,ට පොලිස් විද්‍යාලය නිකවැරටිය ඒකකයේ සහකාර අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී තිස්ස ලාල් ද සිල්වා මහතාට, සහකාර පොලිස් අධිකාරී තිස්ස විතානගේ මහතාටපොලිස් විද්‍යාලය නිකවැරටිය ඒකකයේ ස්ථානාධිපති ප්‍ර.පො.ප. චන්ද්‍රසේන බණ්ඩාර මහතා, ප්‍ර.පො.ප. හේරත් මහතා ඇතුළු පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරී මහතුන්ට, සුනේත්‍රා මල්කාන්ති මහත්මියට,

පාඨමාලාව සාර්ථක කරගැනීම සඳහා බොහෝ දේ කැපකරමින් මා දිරිමත් කළ මා දයාබර

දයාබර අම්මාට, තාත්තාට,බිරිඳ රේණුකාට,

මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

## සංක්ෂිප්තය.

සමාජ ක්‍රමයක මනා පැවැත්ම තහවුරු කිරීම සඳහා එහි නීතිය හා සාමය පවත්වා ගෙන යාම ඉතාමත් අත්‍යවශ්‍ය වේ. නීතිය හා සාමය නොමැති නම් කිසිම සමාජ සංස්ථාවකට සමාජය තුළ හරියාකාරව ක්‍රියාත්මක විය නොහැක. මෙම නීතිය හා සාමය පවත්වාගෙන යාමේ මූලික වගකීම දරණ ආයතනය වන්නේ පොලීසියයි. එබැවින් ඔවුන්ගේ සේවය සමාජයට ඉතාමත් වැදගත් සහ අත්‍යවශ්‍ය සේවාවක් වේ. නමුත් වර්තමානය වන විට මෙම පොලිස් සේවයට ජනතාවගෙන් විවිධ චෝදනා එල්ල වන අතර ජනතාව අතර අප්‍රසාදයට බඳුන් වී ඇති බව විවිධ මාධ්‍ය වාර්තා වලට අනුව හා ජනතාවගේ අදහස් වලින් පෙනී යයි. ඔවුන්ට එල්ල කරන ප්‍රධාන චෝදනාවක් වන්නේ පොලිස් නිලධාරීන් විසින් සැකකරුවන්ට වධ හිංසා කරන බවයි. එසේම ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන පොලිස් වධ හිංසා පිළිබඳව ශ්‍රී ලංකා රජයට චෝදනා එල්ල කරන අතර එම වධ හිංසා සඳහා රාජ්‍ය අනුග්‍රහය ඇති බවටද චෝදනා කරනු ලබයි. පොලිස් නිලධාරීන් විසින් සැකකරුවන්ට වධ හිංසා කිරීම සඳහා යොමුවීමට හේතු සොයා බැලීම ඉතාමත් වැදගත් හා කාලෝචිත බැවින් මෙම අධ්‍යයනය තුළින් ඒ පිළිබඳව සොයා බැලීමට කටයුතු කරන ලදී.

මෙම අධ්‍යයනය සඳහා යොදා ගන්නා නියැදිය ලෙස 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා කාලය තුළදී පොලිස් නිලධාරීන් විසින් සිදු කරන ලද බල අපරාධ වැඩිම සංඛාවක් පිළිබඳව පොලිස් මූලස්ථානයට වාර්තා වී ඇති පොලිස් කොට්ඨාස 03 ක් තෝරා ගන්නා ලදී. ඒ අනුව වැඩිම අපරාධ සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ අනුරාධපුරය, නිකවැරටිය, කුරුණෑගල යන පොලිස් කොට්ඨාස තුළය. අනුරාධපුර පොලිස් කොට්ඨාශයෙන් බල අපරාධ 28 ක් ද, නිකවැරටිය පොලිස් කොට්ඨාසයෙන් බල අපරාධ 19 ක් ද, කුරුණෑගල පොලිස් කොට්ඨාසයෙන් බල අපරාධ 18 ක් ද, වාර්තා වී ඇත. එම නිසා එම පොලිස් කොට්ඨාස තුන (03) මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී. එම පොලිස් කොට්ඨාස තුළ බල අපරාධ මෙන්ම මානව හිමිකම් උල්ලංඝනය කිරීම වලට සම්බන්ධ පොලිස් නිලධාරීන් තිස් දෙනෙකු (30) කොට්ඨාශයකින් 10 ය බැගින් අහඹු ලෙස තෝර ගන්නා ලදී. එසේම එම

පොලිස් කොට්ඨාස වල එම අපරාධවලට මුහුණ දුන් සිවිල් ජනතාවද මෙම නියැදිය තුළට ඇතුලත් කර ඇත. එසේම එම පොලිස් කොට්ඨාශ භාර උසස් පොලිස් නිලධාරීන්ගෙන් ද, එම පොලිස් ස්ථාන භාර පොලිස් නිලධාරීන්ගෙන්ද, මෙම අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන ලදී.

මෙහිදී හඳුනාගත හැකි වූ විශේෂ කරුණක් වූයේ පොලිස් නිලධාරීන් වැඩියෙන්ම වධ හිංසා කිරීම සඳහා යොමු වී ඇත්තේ සැකකරුවන්ගෙන් අපරාධ සම්බන්ධව පාපොච්ඡාරණ ලබාගැනීම සඳහාය. එම ප්‍රමාණය සමස්ථ නියැදියෙන් ප්‍රතිශතයක් ලෙස 43% කි. නිලධාරීන්ගේ කෝපය පාලනය කර ගත නොහැකිව වධ හිංසා සඳහා යොමු වීම නියැදියෙන් දෙවනි තැන ලබා ඇත. එය 23% ක ප්‍රතිශතයකි. වධ හිංසා සඳහා යොමු වීමට බලපා ඇති හේතු අතර තෙවන ස්ථානය ලබා ඇත්තේ වධ හිංසා කරනු ලබන වෙනත් නිලධාරීන්ට සහයෝගය දැක්වීම තුලින් වධ හිංසා සඳහා යොමු වීම වේ. එය 20% ප්‍රතිශතයක් ලබා ඇත. එසේම දේශපාලන හේතු සහ පළිගැනීම සඳහා වධ හිංසා සඳහා යොමු වීම 7% ක ප්‍රතිශතය බැගින් ලබා ඇත. මෙහිදී වධ හිංසා කිරීම සඳහා වැඩියෙන්ම භාවිත කර ඇති ක්‍රමය ලෙස හඳුනා ගත හැකි වූයේ අතින් පයින් පහර දීමයි. එය සමස්ථ නියැදියෙන් ප්‍රතිශතයක් ලෙස 40% කි. වධ හිංසා කිරීම සඳහා බහුලව භාවිත කර ඇති තවත් ක්‍රමයක් නම් පොලු වලින් පහර දීමයි. එම ක්‍රමය නියැදියේ නිලධාරීන්ගෙන් 30% ක් භාවිතා කර ඇත. අත්වල මා පොට ඇඟිලි වලින් එල්ලා පහර දීමේ ක්‍රමය 10% ක් භාවිත කර ඇත. එසේම තවත් වධ හිංසා කිරීමේ ක්‍රම කිහිපයක්ද හඳුනා ගත හැකි විය.

මෙලෙස පොලිස් නිලධාරීන් වධ හිංසා කිරීම සඳහා යොමු වීමට බලපා ඇති ප්‍රධාන හේතුව ලෙස හඳුනා ගත හැකි වූයේ නවීන අපරාධ විමර්ශන ක්‍රම පිළිබඳව ඔවුන් තුළ පවතින අඩු දැනුමයි. එසේම වධ හිංසා කිරීම අපරාධ පිළිබඳව තොරතුරු ඉක්මනින් ලබා ගැනීමට වඩාත් ඉක්මන් හා පහසු ක්‍රමයක් බවට බොහෝ දෙනෙක් තුළ විශ්වාසයක් පවතින බව හඳුනා ගත හැකි විය.

මේ අනුව ජාත්‍යන්තර මට්ටමෙන් ක්‍රියාත්මක වන මානව හිමිකම් සංවිධාන චෝදනා කරන පරිදි වධ හිංසා සඳහා රජයේ අනුග්‍රහය හා දෛනිකව විධිමත්ව සිදුවන වධ හිංසා (Systamatic Torture) ශ්‍රී ලංකාවේ පොලිස් ස්ථාන තුළ නොමැති බවත් නවීන අපරාධ විමර්ශන ක්‍රම වේද පිළිබඳව දැනුමක් නොමැති, ගතානු ගතික ආකල්ප වල එල්බ සිටින,

ස්වයං විනයක් නොමැති පොලිස් නිලධාරීන් සුළු පිරිසක් විසින් පමණක් මෙම වධ හිංසා කරන බවත්.ය ඒ හේතුවෙන් සමස්ථ පොලිස් දෙපාර්තමේන්තුවම අපකීර්තියට ලක් වී ඇති බව පෙනී යයි.

# පටුන.


පිටුව

**පළමුවන පරිච්ඡේදය.**

**පොලිස් නිලධාරීන්ගෙන් සැකකරුවන්ට සිදුවන හිංසාකාරී ක්‍රියා.**

| | |
|---|---|
| 1.1 හැඳින්වීම . | 1 - 8 |
| 1.2 පර්යේෂණ ගැටළුව. | 8 -10 |
| 1.3 පර්යේෂණයේ අරමුණු . | 10 -10 |
| 1.4. අධ්‍යයන ක්ෂේත්‍රය. | 10 -11 |
| 1.5 නියැදිය. | 11 -11 |
| 1.6 මූලාශ්‍ර හා ක්‍රමවේදය. | 11 -12 |
| 1.7. දත්ත රැස් කිරීම. | 12 -13 |
| 1.8 දත්ත විශ්ලේෂණය. | 13-13 |
| 1.9. අධ්‍යයනයේ සීමා. | 13-13 |
| 1.10 පරිච්ඡේදකරණය. | 14-14 |

**දෙවන පරිච්ඡේදය.**

**ශ්‍රී ලංකාවේ පොලිස් සේවාව - ඓතිහාසික වර්ධනය .**

| | |
|---|---|
| 2.1 පොලිස් නිලධාරියා - අර්ථ නිරූපණය. | 15-18 |
| 2.2 එංගලන්ත පොලිස් සේවාවේ ඓතිහාසික වර්ධනය. | 18-22 |
| 2.3 ඇමරිකානු පොලිස් සේවාවේ ඓතිහාසික වර්ධනය. | 22-24 |
| 2.4 ශ්‍රී ලංකාවේ පොලිස් සේවාවේ ඓතිහාසික වර්ධනය. | 24-29 |
| 2.5 ශ්‍රී ලංකා පොලිස් සේවාවේ වර්තමාන ස්වරූපය සහ කාර්‍යභාරය. | 29-34 |

**තෙවන පරිච්ඡේදය.**

**වධ හිංසා, වධ හිංසවන්හි වර්තමාන ස්වරූපය සහ වධ හිංසා වළට එරෙහිව පවතින නීතිය.**

| | |
|---|---|
| 3.1 වධ හිංසා පිළිබඳ ලෝකයේ විවිධ රටවල ඓතිහාසික පසුබිම. | 35-39 |
| 3.2 වධ හිංසා පිළිබඳශ්‍රී ලංකාවේ ඓතිහාසික පසුබිම. | 39-42 |
| 3.3 පොලිස් නිලධාරීන්ගෙන් සැකකරුවන්ට සිදුවන හිංසාකාරී ක්‍රියා අර්ථ දැක්වීම. | 42-44 |
| 3.4 ශ්‍රී ලාංකීය පොලිස් නිලධාරීන් විසින් නරනු ලබනවධ හිංසාවන්හි වර්තමාන ස්වරූපය | 44-56 |
| 3.5 රාජකාරී වල නිරතව සිටින අවස්ථාවල දී පොලිස් නිලධාරීන්ගෙන් වධ හිංසා සිදුවීමට බලපා ඇති හේතු පිළිබඳව පවතින විවිධ මත. | 56-59 |

| | | |
|---|---|---|
| 3.6 | වධහිංසාවලට එරෙහිව පවතින නීතිය. | |
| 3..6.1 | වධහිංසා වලට එරෙහිව පවතින අන්තර්ජාතික නීතිය. | 59-64 |
| 3.6.2.. | වධහිංසා වලට එරෙහිව ශ්‍රී ලංකාව තුල පවතින නීති. | 64-67 |
| 3.7. | ශ්‍රී ලංකාව තුළ වධහිංසා වැළැක් වීම සඳහා ගෙන ඇති පියවර. | 67-69 |
| 3.8. | වධ හිංසාවල බලපෑම. | 69-72 |

**සිව්වන පරිච්ඡේදය.**

**අධ්‍යයන ක්ෂේත්‍රය, නියැදිය සහ දත්ත විශ්ලේශනය.**

| | | |
|---|---|---|
| 4.1. | අධ්‍යයන ක්ෂේත්‍රය හැඳින්වීම. | 73-79 |
| 4.2 | නියැදිය හැඳින්වීම | 79-80 |
| 4.3 | දත්ත විශ්ලේශනය. | 80-94 |
| 4.4 | පොලිස් වධ හිංසාවන්හි සාමාජීය බලපෑම. | 94-95 |

**පස්වන පරිච්ඡේදය.**

**සමාලෝචනය , නිගමන සහ යෝජනා.**

| | | |
|---|---|---|
| 5.1 | සමාලෝචනය . | 95-98 |
| 5.2 | නිගමන හා යෝජනා | 99-100 |
| 5.3 | ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය. | 101-104 |
| 5.4 | උප ග්‍රන්ථය. | |

ඇමුණුම් 01

වධ හිංසා සඳහා යොමු වූ පොලිස් නිලධාරීන්ගෙන් තොරතුරු ලබා ගැනීමසඳහා භාවිත කරන ලද සම්මුඛ සාකච්ඡා උපලේඛණය.

ඇමුණුම් 02

පොලිස් වධ හිංසා වළට මුහුණ දුන් පුද්ගලයින්ගෙන් තොරතුරු ලබා සඳහා භාවිත කරන ලද සම්මුඛ සාකච්ඡා උපලේඛණය .

ඇමුණුම් 03

පර්යේෂණයට භාජනය කරන ලද පොලිස් කොට්ඨාස වළ උසස් නිලධාරීන්ගෙන් තොරතුරු ලබා ගැනීම සඳහා භාවිත කරන ලද සම්මුඛ සාකච්ඡා උපලේඛණය.

## සංඛ්‍යා වගු සහ රූප සටහන්.

- සංඛ්‍යා වගු.


| | | පිටුව. |
|---|---|---|
| 01. වගු 1.1 | පොලිස් නිලධාරීන්ට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණය ලැබුන මානව හිමිකම් කඩවීම් පිළිබඳ පෙත්සම් හා වරදකරුවන් වීම. | 07 |
| 02. වගු 1.2 | පොලිස් නිලධාරීන් විසින් කරන ලද බල අපරාධ - පොලිස් කාට්ඨාස අනුව. | 08 -09 |
| 03. වගු 4.1 | නිකවැරටිය පොලිස් කොට්ඨාසයේ මුළු ජනගහන සංයුතිය - ස්ත්‍රී පුරුෂ භාවය අනුව. | 73 |
| 04. වගු 4.2 | නිකවැරටිය පොලිස් කොට්ඨාසයේ ජනගහන සංයුතිය- ජනවර්ග අනුව. | 73 |
| 05. වගු 4.3 | නිකවැරටිය පොලිස් කොට්ඨාසයේ ජනගහන සංයුතිය - ආගම් අනුව | 74 |
| 06. වගු 4.4 | නිකවැරටිය පොලිස් කොට්ඨාසයේ ජනතාවගේ අධ්‍යාපන පසුබිම. | 74 |
| 07. වගු 4.5 | කුරුණෑගල පොලිස් කොට්ඨාසයේ මුළු ජනගහන සංයුතිය - ස්ත්‍රී පුරුෂ භාවය අනුව. | 75 |
| 08. වගු 4.6 | කුරුණෑගල පොලිස් කොට්ඨාසයේ ජනගහන සංයුතිය- ජනවර්ග උනුව | 75 |
| 09. වගු 4.7 | කුරුණෑගල පොලිස් කොට්ඨාසයේ ජනතාවගේ අධ්‍යාපන පසුබිම. | 76 |
| 10. වගු 4.8 | කුරුණෑගල පොලිස් කොට්ඨාසයේ ජනගහන සංයුතිය - ආගම් අනුව | 76 |
| 11. වගු 4.9 | අනුරාධපුර පොලිස් කොට්ඨාසයේ මුළු ජනගහන සංයුතිය - ස්ත්‍රී පුරුෂ භාවය අනුව. | 77 |
| 12. වගු 4.10 | අනුරාධපුර පොලිස් කොට්ඨාසයේ ජනගහන සංයුතිය - ජනවර්ග අනුව. | 78 |
| 13.වගු 4.11 | අනුරාධපුර පොලිස් කොට්ඨාසයේ ජනගහන සංයුතිය - ආගම් අනුව. | 78 |
| 14. වගු 4.12 | පොලිස් නිලධාරීන් විසින් සිදුකර ඇති වධ හිංසා. | 79 |
| 15. වගු 4.13 | පොලිස් නිලධාරීන් විසින් වධ හිංසා කිරීමට හේතු. | 80 |
| 16. වගු 4.14 | සැකකරුවන්ගෙන් කරන ලද අපරාධ පිළිබඳව පාපොච්ඡාරණ ලබාගැනීම සඳහා පොලිස් නිලධාරීන් විසින් භාවිතාකර ඇති වධ හිංසා ක්‍රම. | 81 |
| 17. වගු 4.15 | පොලිස් නිලධාරීන් වධ හිංසා සඳහා යොමුවීමට බලපා ඇති හේතු. | 83 |
| 18. වගු 4.16 | ප්‍රකෝප වීම නිසා සිදුකරන ලද වධ හිංසා. | 84 |
| 19. වගු 4.17 | භාවිතා කර ඇති වධ හිංසා ක්‍රම හා නිලධාරීන් සංඛාව. | 86 |
| 20. වගු 4.18 | වධ හිංසා සඳහා යොමුවීම - තනතුරු අනුව. | 88 |
| 21. වගු 4.19 | වධ හිංසා සඳහා යොමුවූ නිලධාරීන්ගේ අධ්‍යාපන පසුබිම. | 89 |
| 22. වගු 4.20 | පොලිස් විද්‍යාලයන්හි සේවයේ නියුතු නිලධාරීන්ගේ සංයුතිය සහ අධ්‍යාපන පසුබිම. | 91 |

- රූප සටහන්


| | | |
|---|---|---|
| 01. රූප සටහන 1.1 | තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍ර. | 12 |
| 02. රූප සටහන 2.1 | පොලිස් දෙපාර්තමේන්තුවේ නිල ධුරාවලිය. | 30 |
| 03. රූප සටහන 2.2 | නූතන ශ්‍රී ලාංකීය පොලිස් දෙපාර්තමේන්තුවේ පරිපාලන ව්‍යුහය. | 31 |

## පළමුවන පරිච්ඡේදය.

### පොලිස් නිලධාරීන්ගෙන් සැකකරුවන්ට සිදුවන හිංසාකාරී ක්‍රියා.

### 1.1 හැඳින්වීම .

වත්මන් ශ්‍රී ලංකීය සමාජය පිළිබඳව අවධානය යොමු කරන විට එය ඉතාමත් සංකීර්ණ ස්වරූපයක් ගනී. අපරාධ විද්‍යාත්මක දෘෂ්ඨි කෝණයෙන් බැලුවිට සමාජයේ සීඝ්‍රයෙන් හිස ඔසවන අපරාධ සහ අනෙකුත් නීති විරෝධී ක්‍රියාවන් හේතු කොටගෙන "සමාජ" "ආර්ථික " සහ "පුද්ගල" යන ත්‍රිත්ව පිරිවැයක් දැරීමට රජයට සහ සමස්ත සමාජයට සිදුවී ඇත. මෙවැනි සමාජ පසුබිමක් තුළ ශ්‍රී ලංකා පොලිස් සේවයට මුහුණ දීමට ඇති අභියෝගයන්ද ඉතාමත් සංකීර්ණ ස්වරූපයක් ගෙන ඇත. රටක නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී පොලිසිය ප්‍රධානම ආයතනයකි. අපරාධ යුක්ති පද්ධතිය තුළ පොලිසිය විසින් විශාල වූත් අභියෝගාත්මක වූත් කර්යභාරයක් ඉටුකරයි. එසේම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේදී ජනතාව බොහෝවිට මුලින්ම හමුවන්නේ පොලිසියයි. ඒ අනුව ජනතාවට පොලිසිය නැතිවම බැරි ආයතනයකි. බොහෝ සමාජ වල ජනතාව, පොලිසිය ඉතාමත් බල සම්පන්න යැයි සිතන අතර විශේෂයෙන් දියුණුවන රටවල දුප්පත් හා අඩු අධ්‍යාපනය මට්ටමකින් යුත් ජනතාව එසේ සිතති. ශ්‍රී ලංකාව තුළ ද එවැනි පසුබිමක් අතීතයේ පටන් පැවති අතර මෑත කාලිනව එම තත්වය ජනතාව තුළින් ක්‍රමයෙන් ඉවත්වෙමින් පවතින බව පෙනේ. පොලිසිය යනු අපරාධ හා යුක්තිය සම්බන්ධව ජනතාව සමග සෘජුවම සබඳතා පවත්වන ප්‍රධානතම ආයතනය ලෙස හැඳින්විය හැකිය. පොලිසියේ කාර්යයන් ජනතාව ඉදිරියේ සිදුවන නිසා ඉතාමත් ඉක්මනින් විවේචනයන්ට භාජනය වේ. පොලිසියෙන් බලාපොරොත්තු වන ප්‍රධානතම කාර්යය නම් ජනතාවගේ දේපල හා ජිවිත ආරක්‍ෂා කිරීමයි. ඒ සඳහා පොලිසිය විසින් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරයි. පහත සඳහන් ක්‍රියාමාර්ග ඒවා අතුරින් ප්‍රධාන වේ.

01 අපරාධ වැළැක්වීමේ චේතනාවෙන් කරනු ලබන මුර සංචාරය.

02 අපරාධ සිදුකළ විට ඒවා ගැන විමර්ශනය කර වරද කරුවන් අත් අඩංගුවට ගැනීම

03 වරද කරුවන් උසාවියට ඉදිරිපත් කර නඩු පැවරීම.

04 මෝටර් වාහන වැරදි විමර්ශනය කිරීම සහ නීතිය ක්‍රියාවෙහි යෙදවීම.

05 බල අපරාධ සම්බන්ධ ක්‍රියා මාර්ග.

06 දෛනික ක්‍රියාමාර්ග - සාමය කඩ කරන ක්‍රියාවන් දැන ගත් විට ඒ හා සම්බන්ධව කටයුතු කිරීම හා අවවාද කිරීම ආදී ක්‍රියාවන්.

07 පවුල් හා සම්බන්ධ ආරවුල් වලදී මැදිහත් වී ඒවා සමනය කර ගැනීමට උදව් වීම.

08 මහජන සම්බන්ධතා ඇති කර ගෙන පොලිසියේ ප්‍රතිරූපය වර්ධනය කිරීම.

09 ප්‍රථමාධාර අවශ්‍ය වූ විට ඒවා සැපයීම

(රත්නපාල 1991 ,පි. 9 , 10).

මෙම කාර්යයන් ඉටුකරමින් ජනතාවගේ දේපල හා ජීවිත ආරක්‍ෂා කිරීමේ ක්‍රියාවලියේ දී පොලිසියට විශේෂ බලයක් යටතේ කටයුතු කිරීමට අවස්ථාව සැලසී ඇත. මෙහි දී ඉතාමත් වැදගත් කරුණක් වන්නේ ඔවුන්ට "පුළුල් අභිමතයක්" ඇතිව කටයුතු කිරීමට බොහෝ අවස්ථාවලදී ඇති හැකියාවයි. මෙම පුළුල් අභිමතය යනු විවිධ අවස්ථාවන් වලදී සාමාන්‍ය අවබෝධයෙන් ජනතාවගේ යහපත පිණිස කටයුතු කිරීමයි. එය ස්වෙච්ඡාවෙන් තීරණ ගැනිමේ හැකියාව ලෙස ද හැඳින්විය හැක (රත්නපාල, 1991 ,පි. 31). මෙම අභිමතානුසාරී බලය ක්‍රියාත්මක කිරීමේ දී පොලිසිය දැඩිව විවේචනයට ලක්වන බව පෙනේ. එයට හේතුව එම "පුළුල් අභිමතය" ජනතාවගේ යහපත පිණිස යොදා නොගැනීමයි. පොලිසිය විසින් සිදුකරනු ලබන බොහෝ අපරාධවලට, අත්තනෝමතික ක්‍රියාවලට මෙම "අභිමතය" ඇතිව රාජකාරි කිරීමට ඔවුන්ට ඇති හැකියාව හේතු වී ඇතිබව පෙනේ.

1865 අංක 16 දරණ පොලිස් ආඥා පනතින් ක්‍රමවත් ආකාරයට ස්ථාපිත වූ ශ්‍රී ලංකා පොලිස් සේවයට දැනට වසර 144 ක් ගත වි තිබේ. මේ කාල සීමාව තුළ පොලිස් කාර්‍යයන් විවිධාකාරයෙන් සංශෝධන වලට ලක් වෙමින් අද වන විට පොලිස් කාර්යන් ඉතාමත් පුළුල් හා සංකීර්ණ ස්වභාවයක් ගෙන ඇත. යම් පුද්ගලයෙකු හෝ දේපලක් කෙරෙහි යමෙකු සාහසික මැදිහත් විමක් ඇති වන්නේ නම් හෝ රට වැසියා තුළ බියක් ඇතිකරන සාහසික ක්‍රියා සිදුවන්නේ නම් හෝ පුද්ගලික අයිතිවාසිකම් හෝ දේපල අයිතිවාසිකම් හෝ උල්ලංඝනය වන්නේ නම් ඊට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම හා ඒවා වැළැක්වීමට ක්‍රියා කිරීම පොලිසියේ කාර්යභාරය වේ.

ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය හරයාත්මක නීතිය හා කාර්යය පටිපාටික නීතිය ලෙස වර්ගීකරණයක් දක්නට ඇත. හරයාත්මක නීතිය කඩවීම විමර්ශනය කිරීම කාර්යය පටිපාටිමය නීතිය මගින් සිදුවේ. අපරාධ විමර්ශනය සඳහා පොලිසිය සතුවන බලතල 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ දක්වා ඇත. එසේම සාක්ෂි ආඥා පනත, දණ්ඩ නීති සංග්‍රහය ආදී වූ පනත් මගින් ද පොලිසිය වෙත අති විශාල වූත් සංකීර්ණ වූත් වගකීම් රාශියක් පවරා ඇත.මේ ආකාරයට පොලිස් නිලධාරී නීතිය හා සාමය ආරක්‍ෂා කිරීමට මෙන්ම අපරාධ පාලනය සඳහා ලබා දී ඇති විවිධාකාර බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආරක්‍ෂා කළ යුතුවීම ඔවුන්ගේ ප්‍රධාන වගකීමක් ලෙස සලකයි. මෙහිදී විශේෂයෙන්ම රටේ උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11,12,13,126 යන ව්‍යවස්ථාවන් මගින් ජනතාවගේ මෙම මූලික අයිතිවාසිකම් දක්වා ඇත.

දණ්ඩ නීති සංග්‍රහ පනතේ (15 වන අධිකාරය- 1970 ) 109 (1) වගන්තිය අනුව යම් කිසි ආකාරයකින් නීති කඩවීමක් සිදුවූ බව හෝ සිදු කිරීමට තැත් කරන බවට වාචිකව හෝ ලිඛිතව තොරතුරක් ලද විටක තොරතුර සටහන් කිරීමත් අදාළ සිද්ධිය විභාග කිරීමට පටන් ගැනීම හා අදාළ විමර්ශන නිම කිරීමත්, 120(3) වගන්තිය යටතේ ඒ පිළිබඳව අධිකරණයට වාර්තා කිරීමත් පොලිස් නිලධාරින්ගේ වගකිමකි. තවද අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 110 වගන්තිය මගින් චූදිතයෙකුගෙන් හා සාක්ෂි කරුවෙකුගෙන් ප්‍රකාශයක් සටහන් කරන ආකාරය පිළිබඳවද , නීතිමය වලංගුභාවය අනුව සාක්‍ෂියක් ලෙස යොදා ගත හැකි ආකාරය ද සඳහන්ව ඇත. ප්‍රථම තොරතුරු සටහන් කර ගැනීමට භාවිත කරන තොරතුරු පොත සාක්ෂි ආඥා පනතේ 74 වගන්තිය අනුව ප්‍රසිද්ධ ලේඛණයක් වේ. එසේම අපරාධ නඩු විධාන සංග්‍රහයේ 109 (6) වගන්තිය අනුව තොරතුරු සැපයිය හැකි පුද්ගලයන්ට පැමිණෙන ලෙස නියම කිරීමට බලයක් පොලිස් නිලධාරීන්ට ඇති අතර දණඩ නීති සංග්‍රහය 172 වගන්තිය අනුව එම අණ නොපිළිපදින අයට අධිකරණය මගින් දඬුවම් පැමිණවිමට කටයුතු කළ හැකිය. එසේම ප්‍රකාශ සටහන් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 109,110,111, යන වගන්තිවල සඳහන් කර ඇත. එවැනි අවස්ථාවල තර්ජනයක්, පෙළඹවීමක් නොකළ යුතු බව දක්වා ඇත. එසේම සාක්‍ෂි ආඥා පනත මගින් සාක්‍ෂි වල වලංගුභාවය මෙන්ම එහි 17 (1)(2), 25(1), 27, දරණ වගන්ති හා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 110(3) මගින් පොලිස් නිලධාරියෙකු ඉදිරියේ කරනු ලබන පාපොච්චාරණයක් ඔප්පු කිරීමේ ප්‍රතිපාදන සඳහන් කර ඇත. එසේම දණ්ඩ නීති සංග්‍රහය 177 වගන්තිය අනුව